# පුරප්පාඩු
# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතන වල සේවය තහවුරු කරන ලද ස්ථිර සේවක භවතුන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

සෑම අයදුම්පතක්ම මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කොට මෙම විශ්වවිද්‍යාලයේ නම්, අදාල අංශ ප්‍රධාන, පීඨාධිපති මගින්ද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ/විශ්වවිද්‍යාලයක/ආයතනයක/අනුබද්ධිත විශ්වවිද්‍යාලයක/මණ්ඩපයක නම් එහි ලේකම්/ලේඛකාධිකාරී/අධ්‍යක්ෂ/ආයතන ප්‍රධානියා/මණ්ඩපාධිපති මගින් **2025.05.23** වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **නියෝජ්‍ය ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ**. යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය. අයදුම්පත්‍රය බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාල තනතුර සඳහන් කරන්න.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල ඡායා පිටපත් අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළවිට කුමන හේතුවක් නිසා හෝ යලි සලකා බලනු නොලැබේ.

## 1. වැඩ අධිකාරී (II ශ්‍රේණිය)

**සුදුසුකම් :-**

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව (NDT) හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රය පිළිබඳව වසර 04 ක පළපුරුද්ද.

සටහන : ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ වසර 04 හි පුහුණු කාලසීමාව ඉල්ලුම් කරනු ලබන පළපුරුද්දට අදාළ නොවේ.

හෝ

(ii) ජාතික තාක්ෂණික සහතිකපත් පාඨමාලාව (NCT) හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 10 ක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :- රු. 61,275 – 18x890 –77,295 (මාසික) U-MN 2(II)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම :-** සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 2. පුහුණුවන තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය 'ආ' ඛණ්ඩය

**සුදුසුකම් :-**

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 05 ක් සහිතව විෂයයන් 06 ක් සමත් විය යුතු අතර, සම්මාන සාමාර්ථ 05 ට විද්‍යාව සහ ගණිතය යන විෂයයන් ඇතුලත් විය යුතුය.

හෝ

(ii) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී විද්‍යාව සහ ගණිතය යන විෂයයන් දෙක ඇතුළුව විෂයයන් 06 කින් සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම සහ විශ්වවිද්‍යාල

ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක වසර 08 ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

(iii) උසස් අධ්‍යාපන ආයතනයක/ආයතනයක විද්‍යාගාර සහායක තනතුරක වසර 15 ක ස්ථිර සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

වැටුප් පරිමාණය **:- රු. 51,095-7x540; 10x640- 60,575 (මාසික) U-MT 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම **:-** යෝග්‍යතා පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**3. <u>තාක්ෂණික නිලධාරී (විදුලි) III ශ්‍රේණිය</u>**

**සුදුසුකම් :-**

(i) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ එක් වරකදී විෂයයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

සහ

(ii) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ වෙනත් පිළිගත් ආයතනක් විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම 5 වන මට්ටම (N.V.Q. Level 5) හෝ ඊට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය. (පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commssion) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.)

වැටුප් පරිමාණය **:- රු. 51,095-7x540; 10x640- 60,575 (මාසික) U-MT 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම **:-** ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**4. <u>තාක්ෂණික නිලධාරී (යාන්ත්‍රික) III ශ්‍රේණිය</u>**

**සුදුසුකම් :-**

(i) අ .පො. ස. (උ/පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ එක් වරකදී විෂයයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

සහ

(ii) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ වෙනත් පිළිගත් ආයතනක් විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම 5 වන මට්ටම N.V.Q. Level 5) හෝ ඊට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය. (පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commssion) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.)

වැටුප් පරිමාණය **:- රු. 51,095-7x540; 10x640- 60,575 (මාසික) U-MT 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම **:-** ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**5. <u>තාක්ෂණික නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය) III ශ්‍රේණිය</u>**

**සුදුසුකම් :-**

(i) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවක් යටතේ එක් වරකදී විෂයයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

සහ

(ii) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ වෙනත් පිළිගත් ආයතනක් විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද තොරතුරු සන්නිවේදන හා බහු මාධ්‍ය තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / තොරතුරු තාක්ෂණය ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම 5 වන මට්ටම (N.V.Q. Level 5) හෝ ඊට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය. (පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commsssion) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.)

- තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සේවා පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ

වැටුප් පරිමාණය :- **රු. 51,095-7x540; 10x640- 60,575 (මාසික) U-MT 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**6. <u>වෘත්තීය ශිල්ප ප්‍රදර්ශක III ශ්‍රේණිය (යාන්ත්‍රික / වෑද්දුම්)</u>**

**සුදුසුකම් :-**

(i) පහත සඳහන් ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි ගණනක පළපුරුද්ද තිබිය යුතුය.

වාත්තු වැඩ, පෑස්සුම් සහ කම්හල් වැඩ, යාන්ත්‍රික උපාංග, රථා සැකසීම, තහඩු වැඩ, වඩු වැඩ, ලෝහ වැඩ.

<u>සටහන</u> : ඉහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් එකකට වැඩි ගණනක් සඳහා පළපුරුද්ද ඇති අය කෙරෙහි ප්‍රමුඛත්වය දක්වනු ලැබේ.

සහ

(ii) විශ්වවිද්‍යාල / රාජ්‍ය සේවයේ හෝ පිළිගත් ආයතනයක පුහුණු ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

(iii) විශ්වවිද්‍යාලයක / රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් ආයතනයක අවම වසර තුනක කාලයක් ඉහත අංක එක (i) යටතේ සඳහන් විෂය ක්ෂේත්‍රයක විශේෂ ශ්‍රේණියේ පුහුණු ශිල්පියෙකු වශයෙන් සේවයේ යෙදී තිබීම.

වැටුප් පරිමාණය :- **රු. 49,475-17x540 - 58,655 (මාසික) U-MN 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 7. <u>කළමනාකරණ සහකාර (සරප්) III ශ්‍රේණිය</u>

**සුදුසුකම් :-**

1. අ.පො.ස (සා/පෙළ) විභාගයේදී

   (i) සිංහල භාෂාව/දෙමළ භාෂාව
   (ii) ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
   (iii) ගණිතය

   යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

2. අ.පො.ස (උ/පෙළ) විභාගය එක් වරකදී ගණකාධිකරණය ඇතුලුව සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

<u>සටහන</u> :- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය තීරණය කර ඇති පරිදි ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 49,475-17x540 - 58,655 (මාසික) U-MN 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම :-** ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**සටහන :-** ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
මනා චරිතවත් පුද්ගලයකු විය යුතුය.

## 8. <u>කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) III ශ්‍රේණිය</u>

**සුදුසුකම් :-**

1. අ.පො.ස (සා/පෙළ) විභාගයේදී

   (i) සිංහල භාෂාව/දෙමළ භාෂාව
   (ii) ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
   (iii) ගණිතය

   යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

2. අ.පො.ස (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

තනතුරට විශේෂ වූ සුදුසුකම්

ඉහතින් දක්වා ඇති සුදුසුකම් වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) තනතුරට විශේෂ වූ සුදුසුකම් සපුරාලිය යුතුය.

• ගබඩා පරිපාලනය පිළිබද වසරක පළපුරුද්ද සහ/හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී වාණිජ්‍ය විෂය සමත්ව තිබීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ගණකාධිකරණය විෂය සමත්ව තිබීම.

සටහන :- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය තීරණය කර ඇති පරිදි ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 49,475-17x540 - 58,655 (මාසික) U-MN 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම :-** ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**සටහන :-** ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
මනා චරිතවත් පුද්ගලයකු විය යුතුය.

**9. පුස්තකාල තොරතුරු සහකාර (III ශ්‍රේණිය)**

**සුදුසුකම් :-**

1. අ.පො.ස (සා/පෙළ) විභාගයේදී

(i) සිංහල භාෂාව/දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
(iii) ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම.

සහ

2. උසස් අධ්‍යාපන ආයතනයක පුස්තකාලයේ වසර 05ක අඛණ්ඩ සතුටුදායක සේවයක් සහිත U-PL වැටුප් බාණ්ඩයට අදාළ ප්‍රාථමික ශ්‍රේණි ස්ථිර තනතුරක තනතුරේ තහවුරු කර තිබිය යුතුයි.

* පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු කාලසීමාවක පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**වැටුප් පරිමාණය :- රු. 49,475-17x540 - 58,655 (මාසික) U-MN 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම :-** සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**10.** <u>ආරක්ෂක පරීක්ෂක (II ශ්‍රේණිය)</u>

**සුදුසුකම් :-**

1. (අ) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/ගණිතය/වාණිජ්‍ය අංක ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්විය යුතුය.

හෝ

(ආ) තුන්වතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/ගණිතය/වාණිජ්‍යය අංක ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වසර 05 කට නොඅඩු සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

2. පොලිස් හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක, වෙනත් පිළිගත් ආරක්ෂක ආයතනයක ආරක්ෂක අංශයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

3. ක්‍රීඩාවන්හී ක්‍රියාශීලී ලෙස සහභාගී වී තිබිය යුතුය.

4. උස - අඩි 5 අඟල් 4 කට වඩා අඩු නොවිය යුතුය.

   පපුව - අඟල් 34 කට වඩා අඩු නොවිය යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 49,475-17x540 - 58,655 (මාසික) U-MN 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම :-** සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**11.** <u>**වැද්දුම්කරු (III ශ්‍රේණිය) / පැස්සුම්කරු (III ශ්‍රේණිය) / යාන්ත්‍රික ශිල්පී (III ශ්‍රේණිය)**</u>

**සුදුසුකම් :**

1. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා ඉහත එක් එක් තනතුරුවල කාර්යයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. (පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commsssion) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.)

හෝ

2. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අදාළ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවමය වසර පහක (05) සේවා පළපුරුද්දක් සමඟ ඉහත එක් එක් තනතුරුවල කාර්යයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා ලබා ඇති බව වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කර තිබීම.

වෙනත් :

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
III. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 48,005 - 16x490 - 55,845 (මාසික) U-PL 3(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම :-** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**12. <u>විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :**

1. (අ) ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ විද්‍යාගාර සහායක කාර්යයට අදාල තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් N.V.Q. 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. (පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commsssion) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.)

හෝ

(ආ) ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

2. නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අදාළ තනතුරට අදාළ කාර්මික කුසලතා සහිත ක්ෂේත්‍රයේ අවමය වසර පහක (05) සේවා පළපුරුද්දක් තිබීම.

**වෙනත්:**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
III. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 44,575 - 16x490 - 52,415 (මාසික) U-PL 2(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම :-** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

ඒ.බී. වැලිවිට
ලේඛකාධිකාරී